**හොරණ නගර සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.360,503 ක් වූ වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත්වල වටිනාකම රු.15,821,566 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.15,751,244 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පත්වල වටිනාකම රු.70,322 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.1,404,877 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.1,360,673 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලී ආදායම හා ලැබිය යුතු පොලී ආදායම රු.44,204 බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ රු.7,622,089 ක් වූ මුද්දර ගාස්තු ආදායම සමුච්චිත අරමුදල් ගිණුමට බැර කළ යුතු වුවත්, වර්ෂයේ ආදායමක් ලෙස

ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.7,622,089 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2012 විගණකාධිපති වාර්තාවේ 2.2.1(උ) නිවැරදි කිරීම සඳහා හිඟ හිටි ආදායම් ගිණුම රු.51,500 ක් හර කර සමුච්චිත අරමුදල් ගිණුම රු.51,500 ක් බැර කළ යුතු වුවත් වෙනත් ආදායම් ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කර තිබීම හේතුවෙන් හිඟ හිටි ආදායම් ගිණුම රු.51,500 කින් අඩුවෙන්ද සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම රු.51,500 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.92,049,649 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.21,329,552 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 16,034,684 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,294,868 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 17,592 | 15,742 | 6,302 |
| (ii) බදු කුලී | 4,853 | 4,016 | 1,476 |
| (iii) බලපත්‍ර ගාස්තු | 180 | 180 | -- |

2.2.2 <u>වරිපනම් බදු</u>

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.5,681,131 ක වරිපනම් හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.3,410,216 ක් හෙවත් සියයට 60 ක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කළ ආදායම රු.14,865,461 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඉන් රු.13,035,794 ක් හෙවත් සියයට 88 ක් අයකරගෙන තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ වරිපනම් ශේෂය රු.5,204,367 ක් වූ අතර එහි වර්ෂ 3 ඉක්ම වූ හිඟ ශේෂය රු.1,256,057 ක්ද, වර්ෂ 5 ඉක්ම වූ හිඟ ශේෂය රු.359,343 ක්ද, වර්ෂ 10 ඉක්ම වූ හිඟ ශේෂය රු.262,801 ක්ද විය. මේ අනුව හිඟ වරිපනම් බදු අයකරගැනීමේ දුර්වලතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

2.2.3 <u>ව්‍යාපාර බදු</u>

2016 වර්ෂයට අදාල ව්‍යාපාර බදු බිල් කිරීම රු.2,005,080 ක් වූ අතර ඉන් රු.1,990,080 ක් අයකරගෙන තිබුණි. රු.15,000 ක ශේෂයක් වර්ෂය තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 <u>කඩ කුලී</u>

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.1,499,302 ක කඩ කුලී හිඟයක් පැවති අතර වර්ෂය තුළදී ඉන් රු.841,022 ක් හෙවත් සියයට 56 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට විගණනයට ලබා දුන් හිඟ ආදායම් වාර්තාව හා කඩ කුලී ලේඛණය අතර රු.451,179 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස දිගින් දිගටම පවතින අතර වෙනසට හේතුව කළමනාකරණය විසින් පැහැදිලි කිරීමට අපොහොසත් වුණි.

(ඇ) කඩකාමර කුලී අයකිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් තක්සේරු මුදල යොදා නොගෙන නව තක්සේරුවට පෙර පැවති කඩකාමර කුලිය හා තක්සේරු දෙපාර්තමේන්තුව ලබා දුන් තක්සේරු මුදල අතර වෙනසින් සියයට 50 ක මුදලක් වැඩි කර අයකිරීම නිසා සභාවට විශාල ආදායමක් අහිමි වී තිබුණි.

2.2.5 **රථවාහන නවතා තැබීමේ ගාස්තු**

සභා බල ප්‍රදේශයේ නැවතුම් ස්ථානවල නවතා තබන ත්‍රීරෝද රථ ලියාපදිංචි කරවාගෙන ගාස්තුවක් අයකරගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) **වාහන උපයෝජනය**

පසුගිය වර්ෂයේ විගණන වාර්තාවේ 4 ඡේදයේ 4.1(අ)(i) ඡේදය මගින් පෙන්වා දුන් පරිදි වාහන අනතුරු/ අළුත්වැඩියා කිරීම්, රක්ෂණ වන්දි ලැබීම් සම්බන්ධයෙන් හා එකී අනතුර පිළිබඳව මු.රෙ. 104 ප්‍රකාරව කටයුතු කර පරීක්ෂණ පවත්වා අලාභ හානි සම්බන්ධව වගකිවයුත්තන් නිශ්චය කර හානියේ වටිනාකම අයකරගැනීමට 2017 මැයි 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) **සභාපතිවරුන් හා නාගරික මන්ත්‍රීවරුන් ආපසු භාර නොදුන් භාණ්ඩ**

පසුගිය වර්ෂයේ විගණන වාර්තාවේ 4 ඡේදයේ 4.1(ආ) මගින් පෙන්වා දුන් පරිදි සභාපති හා නාගරික මන්ත්‍රීවරුන් වෙත නිකුත් කළ ජංගම දුරකථන 06 හා GI බට 01 ක් 2017 මැයි 15 දින වන විටත් ආපසු ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **ගිනි නිවීමේ ඒකකය හා සම්බන්ධ ගනුදෙනු**

ගිලන් රථ සේවාව සැපයීම වෙනුවෙන් මුදල් ලබාගැනීම ණය පදනම මත හා මුදල් පදනම මත සභා තීරණයකින් තොරව සිදු කර තිබුණු අතර එම මුදල් ලබාගැනීම ගිනි නිවන ඒකකයට ලබා දී තිබූ තාවකාලික ලදුපොත් මගින් සිදු කර තිබුණි. මෙම ලදුපොත් මගින් මුදල් එකතු කිරීම, අවසන් වූ ලදු පොත් භාර දීම නැවත ලදු පොත් නිකුත් කිරිම සම්බන්ධව කිසිදු අභ්‍යන්තර පාලනයක් හෝ අධීක්ෂණයක් සිදු වී නොතිබීම හේතුවෙන් රු.60,163 ක ලැබිය යුතු මුදලක් ගිණුම් ගත වී නොතිබුණි.

(ඇ) <u>අස්ථාන ගත වූ පුස්තකාල පොත්</u>

නගර සභාව විසින් පවත්වා ගෙන යනු ලබන හොරණ මහජන පුස්තකාලයේ රු.3,396 ක් වටිනා පොත් 22 ක්ද, රැටියල පඤ්ඤාසාර නාහිමි අනුස්මරණ මහජන පුස්තකාලයේ රු.275 ක් වටිනා පොත් 03 ක්ද, කරුණාසේන ජයලත් අනුස්මරණ ළමා පුස්තකාලයේ රු.8,822 ක් වටිනා පොත් 40 ක්ද අස්ථාන ගත වී ඇති බව පොත් සමීක්ෂණයේදී හදුනාගෙන තිබූ නමුත් ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.2 <u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්</u>

(අ) නාගරික සංවර්ධන අධිකාරී ගිණුමේ 2009 වර්ෂයේ සිට පැවත එන රු.99,885 ක් වූ ශේෂය නිශ්කාර්යව පැවතුණි.

(ආ) 2009 වර්ෂයේදී රු.5,200,445 ක වියදමක් මත ඉදි කර ඇති සෝමානන්ද මාවත (බස් නැවතුම්පල අසල) වැසිකිළි පද්ධතිය හා නාන කාමරය යන දෙකෙන් වැසිකිළි පද්ධතිය පමණක් මහජන පරිහරණය සඳහා භාවිතා කරන අතර නාන කාමර පද්ධතිය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

(ඇ) සභාව සතු වාහන දෙකක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 <u>ඉඩම් හා ගොඩනැගිලි</u>

නගර සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර තිබූ නමුත් සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි එම ස්ථාවර වත්කම් ලේඛනයෙහි සටහන් කර නොතිබූ අතර සභාව සතුව නිත්‍යානුකූලව හිමිකම් ඔප්පු පවතින ඉඩම් හා ගොඩනැගිලි පමණක් එහි සටහන් කර තිබුණි.

තවද, සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) <u>ළමා පුස්තකාලය හා ළමා ක්‍රීඩාංගණය</u>

මෙම ඉඩම සඳහා හිමිකම් ඔප්පුවක් නොතිබූ අතර ක්‍රීඩාංගණයේ කොටසක බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් වෙළසැලක් ඉදි කර ගෙන ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යමින් තිබුණි.

(ආ) <u>වැවල පිහිටි පුස්තකාල හා පෙර පාසල පිහිටි ඉඩම</u>

රූඩ් 02, පර්චස් 24.05 ක් වූ මෙම ඉඩමෙන් පර්චස් 10 ක පමණ ප්‍රමාණයක් බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබූ අතර, එම අනවසරයෙන් අල්ලා ගත් කොටස සභාවට ආපසු ලබාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) <u>රෝයල් ගාඩන්ස් (හොරණවත්ත වෙන්දේසි ඉඩම)</u>

වෙන්දේසි ඉඩමකින් පොදු පහසුකම් සඳහා ලැබී තිබූ රූඩ් 02, පර්චස් 06 ක් වූ මෙම ඉඩමෙන් කොටසක් යාබද ඉඩම්හිමියා විසින් අල්ලා ගෙන ඔහුගේ නිවස පුළුල් කරගෙන තිබුණු අතර මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර අනවසරයෙන් අල්ලාගෙන ඇති සභාව සතු ඉඩම ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) <u>රෝස්වුඩ් වත්ත</u>

නගර සභා ක්‍රීඩාංගනය ආසන්නයේ පවතින අක්කර 03, පර්චස් 05 ක විශාලත්වයෙන් යුතු මෙම ඉඩම 1971 වර්ෂයේදී පැවරුම් ඔප්පුවක් මගින් ලැබී තිබුණු අතර මෙම ඉඩම නගර සභාවට පවරා ඇත්තේ නගර සභා ගොඩනැගිල්ල හා නගර සභාවේ සේවක මණ්ඩලයට නිවාස ඉදිකිරීම සඳහා වුවත්, වර්තමානයේ මෙම ඉඩමෙහි නගර සභා සේවකයින් හා ඔවුන්ගෙන් පැවත එන පරම්පරාවන් ගණනාවක් හා බාහිර පුද්ගලයින් කිහිපදෙනෙකු විසින් නිවාස තනා ගෙන අනවසරයෙන් පදිංචි වී තිබුණි.

(ඉ) <u>හාල්ගල්ගොඩැල්ල ඉඩම</u>

අක්කර 01, රූඩ් 02, පර්චස් 13 ක් විශාල මෙම ඉඩමෙහි විශාල පිරිසක් අනවසරයෙන් නිවාස සාදාගෙන පදිංචි වී තිබූ අතර අනවසර පදිංචිකරුවන් ඉවත්කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.4 <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

(අ) සභා බල ප්‍රදේශයේ එක් රැස් වන නොදිරන කසළ බැහැර කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොමැති වීම හා එම කාර්යය බාහිර පාර්ශවයක් ලවා සිදු කිරීම නිසා 2015 හා 2016 වර්ෂ වෙනුවෙන් රු.6,319,970 ක් වන විශාල වියදමක් දැරීමට සභාවට සිදු වී තිබුණි. මෙම පිරිවැය ආවරණය කරගැනීම සඳහා කසළ බදු පැනවීමටත් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීමටත් සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) අක්කර 01, රූඩ් 02, පර්චස් 27 ක් විශාල මෙම ඉඩමෙහි කොටසක සභාවේ සුළු සේවකයෙකු විසින් නිවසක් තනාගෙන තිබුණු අතර මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. අළුබෝගහවත්ත ඉඩමේ වැඩ අංගනයක් හා කසල

මධ්‍යස්ථානයක් සඳහා ගොඩනැගිලි ඉදි කර තිබුණි. මෙම වැඩ අංගනයෙන් දැනට ප්‍රයෝජනයක් නොගන්නා අතර කසළ මධ්‍යස්ථානයේ කසළ වර්ගීකරණයක් පමණක් සිදු කරමින් තිබුණි. සභාව විසින් කසළ අපහරණය කිරීම සඳහා 2016 වර්ෂයේදී පමණක් රු.4,056,250 ක් වැය කර තිබූ අතර කසල ප්‍රතිචක්‍රීකරණයක් සිදු කර කොම්පෝස්ට් නිෂ්පාදනයක් සිදු කිරීමටද කටයුතු කර නොතිබුණි.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) අපද්‍රව්‍ය කළමනාකරණය

(ඉ) ස්ථාවර වත්කම් පාලනය